**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2017**

**-----------------------------------------------**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මධ්‍යස්ථානයේ සභාපති වෙත 2018 ජූලි 09 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම විගණන වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පිරිවැය රු.5,387,674 ක් වූ ප්‍රධාන කාර්යාල භූමියේ තිබූ පැරණි පරිපාලන ගොඩනැගිල්ලෙන් හරි අඩක් 2018 පෙබරවාරි 23 දින කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම ආරම්භ කර තිබූ නමුත්, මේ පිළිබඳව ප්‍රමිතයේ 29 (ඉ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 132 ඡේදය ප්‍රකාරව මධ්‍යස්ථානය විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාලව අනුගමනය කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ සේවකයින් 03 දෙනෙකුට අදාළව සේවා කාලය වර්ෂයක් අඩුවෙන් ගණනය කර පාරිතෝෂික ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව පාරිතෝෂික වටිනාකම හා පාරිතෝෂික වෙන් කිරීම් රු.59,652 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයට අයත් සංවර්ධන වැඩ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානය වෙත ලැබිය යුතු රු.262,260 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා උපදේශන සේවා සහ තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා ගෙවන ලද එකතුව රු.969,260 ක් වූ මූලික වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමට ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුම යටතේ ප්‍රාග්ධනීත කර තිබුණි.

(ඈ) 2018 වර්ෂය සඳහා ගෙවන ලද එකතුව රු.80,000 ක වරිපනම් බදු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන අනුව, ස්ථාවර වත්කම් ගිණුම් 07 ක එකතු වටිනාකම රු.70,963,010 ක් වුවද, සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එම වත්කම් වල එකතු වටිනාකම රු.56,526,211 ක් වූයෙන් රු.14,436,799 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

සමාලෝචිත වර්ෂය තුළ ජර්නල් සටහන් 13 ක් භාවිතා කර එකතුව රු.29,480,402 ක් ගිණුම්ගත කර තිබුණද ජර්නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොවිය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.7,996,367 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 1 සිට වසර 3 අතර වූ ණය ශේෂ වල එකතුව රු.1,054,140 ක් සහ වසර 3 හා ඊට වැඩි ණය ශේෂවල එකතුව රු.744,806 ක්ද වූ අතර, මෙම ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.968,664 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 1 සිට වසර 3 අතර වූ ශේෂය රු.408,657 ක්ද, වසර 3 ට වඩා වැඩි ණය ශේෂවල වටිනාකම රු.310,007 ක්ද වූ අතර, මෙම ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 138 (6) | ගෙවීමකට අදාළ ඉන්වොයිස් පත්‍ර සහ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂිවල මුල් පිටපත් වවුචරය සමග ඉදිරිපත් කිරීමකින් තොරව වවුචර් 03 ක් භාවිතා කර එකතුව රු.121,723 ක ගෙවීම් සිදු කර තිබුණි. |
| (ආ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා අත්තිකාරම් ලබාදිය හැකි අතර එම සීමාවන් ඉක්මවීමට අවශ්‍ය අවස්ථා වලදී භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතුය. එහෙත් එසේ පූර්ව අවසරය ලබා ගැනීමකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 05 කදී එකතුව රු.3,362,045 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2000 ජනවාරි 11 දිනැති අංක පීඊ/පීඊ/5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දීමනා, දිරිගැන්වීම් දීමනා හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 78 දෙනෙකු වෙත එකතුව රු.1,170,000 ක් දිරිදීමනා ලෙස ගෙවීම් කර තිබුණි. විධිමත් ඇගයීම් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මෙම දිරිදීමනා ගෙවීම් කර තිබූ අතර, ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධාන මගින් ශිල්පීන්ගේ සංවර්ධන කාර්යයන් සඳහා ලැබූ මුදල් භාවිතා කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,671,395 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,208,630 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,462,765 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.3,270,032 කින් හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වූ භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.7,994,423 කින් වැඩිවීමත් වෙනත් වියදම් රු.3,352,769 කින් අඩුවීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ මූල්‍ය ඌනතාවයක් ඇතිවී තිබූ අතර, අනෙකුත් වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමේදී මධ්‍යස්ථානයේ දායකත්වය 2013 වර්ෂයේදී රු.40,772,386 ක් වූ අතර, එය ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.66,784,173 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය පිහිටුවා තිබූ අතර, පනතේ 82 වන වගන්තිය ප්‍රකාරව දක්වා තිබූ බලතල හා කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන මෝස්තර නිර්මාණය 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණද 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මෝස්තර නිර්මාණ සංඛ්‍යාව සියයට 34 කින් එනම්, 317 කින් අඩුවී තිබුණි. මෙම අඩුවීම සඳහා වඩාත් සුදුසු නිර්මාණ පමණක් ශිල්පීන්ට හඳුන්වා දී ප්‍රගතියට ඇතුළත් කිරීමත්, නිර්මාණකරුවන් දෙදෙනෙකුගේ සේවය සමාලෝචිත වර්ෂය තුළ ලබා ගැනීමට නොහැකි වීමත් හේතු වී තිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් 2013, 2014 වර්ෂවල පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාවේ වැඩිවීමක් සිදුවී තිබුණද, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛන්ඩව අඩුවී තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 12 කින් හෙවත් සියයට 19.3 කින් අඩුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ රු.1,500,000 ක් වැයකර කාර්ය මණ්ඩලයේ 82 දෙනෙකුගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද, රු.900,000 ක් පමණක් වැය කර සේවකයින් 50 දෙනෙකු පමණක් පුහුණු කර තිබූ අතර භෞතික කාර්යසාධනය සියයට 61 ක් පමණක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ශිල්පීන්ට නව තාක්ෂණික යන්ත්‍ර සහ උපකරණ ලබාදීම සඳහා රු.13,250,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, එම කාර්යයන් සඳහා දරන ලද සත්‍ය වියදම රු.3,003,000 ක් විය. ඒ අනුව, මෙම කාර්යය ඉටු කිරීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 22.6 ක් වූ අතර, එම අරමුණු ඉටු කිරීමේ භෞතික ඉලක්ක විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා භෞතික කාර්ය සාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඉ) මධ්‍යස්ථානය පිහිටුවීමේ පනතට අනුව, ඉටුකළ යුතු කාර්යයන් අතර, ආයතනයේ තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.50,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ විරල අමුද්‍රව්‍ය සඳහා ආදේශන සහ කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලීන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට එකතුව රු.500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය තුළ රු.39,000 ක් වැය කර අත්හදා බැලීමේ කාර්යයක් පමණක් ඉටු කිරීම නිසා මෙම ඉලක්ක ළඟාකරගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ සහ ශිල්පීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහන යටතේ ශිල්පීන් වෙත ප්‍රදානය කිරීම සඳහා 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මිලදීගෙන තිබූ එකතුව රු.1,728,925 ක උපකරණ හා මෙවලම් මෙම වාර්තාවේ දින වන විටත් එම ශිල්පීන්ට බෙදා දී නොතිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය සඳහා පැරණි කාර්යාල ගොඩනැගිල්ල කඩා ඉවත් කර නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.80,000,000 ක් වැය කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් සැලසුම් අනුමත කිරීම සහ උපදේශක සේවා සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.969,260 ක් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවීම් කිරීම පමණක් සිදුකර තිබූ අතර, ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත භූමියේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට දීර්ඝ කාලයක සිට පැවත එන මෝස්තර උපදේශන ගිණුම යටතේ අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබූ එකතුව රු.335,666 ක නොපියවූ අත්තිකාරම් හඳුනාගෙන පියවීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

පූර්ව සැලසුමක් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විදේශාධාර ව්‍යාපෘති 02 ක් වන Oxfam සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP) සඳහා ලැබී තිබූ අරමුදල්වලින් රු.4,661,732 ක සිට රු.16,263,617 ක් දක්වා වූ පරාසයක අරමුදල් වර්ෂය මුළුල්ලේම බැංකු ජංගම ගිණුමක ඌන උපයෝජිතව පැවතුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 109 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 87 දෙනෙකු වූයෙන් සමස්ත කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 22 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි. මෙම කාර්ය මණ්ඩල ඌනතාවය නිසා අභ්‍යන්තර පාලනය, වැඩ බෙදීම, අභ්‍යන්තර පරීක්ෂාව හා අභ්‍යන්තර විගණනය යන කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමේ ප්‍රමාදයන් පැවතුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්ජී/එස්ඩීපී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව හා රාජ්‍ය ආයතනයක් විසින් කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. ඒ අනුව, මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය තුළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා "දරිද්‍රතාවය පිටු දැකීම" අරමුණ පදනම් කරගෙන දර්ශක ගොඩනගා තිබූ අතර, මූලික සැලසුම් සකස් කරමින් ශිල්පීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට අවශ්‍ය පියවර ගනිමින් පැවතුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, මධ්‍යස්ථානයේ 2017 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**6.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශය සඳහා ස්ථිර නිලධාරියෙකු 2017 නොවැම්බර් මාසයේදී බඳවාගෙන තිබූ අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් එම අංශය වෙත අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය මගින් සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කර නොතිබුණි.

**6.3 අයවැය ලේඛනමය පාලනය**

රේඛීය අමාත්‍යාංශය මගින් සංවර්ධන වැඩසටහන් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනය රු.7,976,511 ක් වුවද, එම ප්‍රතිපාදනය ඉක්මවා රු.4,707,602 ක වියදම් දරා තිබූ අතර, යන්ත්‍ර උපකරණ සඳහා වර්ෂය තුළ රු.10,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන අනුමත කර තිබුණද, එම ප්‍රතිපාදනය ඉක්මවා රු.486,850 ක වියදම් දරා තිබුණි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව, මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණිත ගිණුම් සමග විගණන වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා 2018 ජූනි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම, බැංකු සැසඳුම්වල දක්වා තිබූ දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ හඳුනා ගෙන නිරවුල් නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් නොකිරීම හා සමීක්ෂණ සිදු කිරීම ප්‍රමාද වීම. |
| (ඇ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා නොදීම හා අභ්‍යන්තර විගණනය කාර්යක්ෂමව ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය | ස්ථිර තනතුරු සඳහා දීර්ඝ කාලයක සිට කොන්ත්‍රාත් සේවකයන් සේවයේ යෙදවීම, ස්ථිර තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් ප්‍රමාද කිරීම. |
| (ඉ) ගබඩා පාලනය | ගබඩා ද්‍රව්‍ය සහ මිලදී ගනු ලබන භාණ්ඩ නිසි පරිදි තොග ලේඛනවල ඇතුළත් නොකිරීම හා තොග ලේඛන නිසි පරිදි යාවත්කාලීන නොකිරීම. |